# අංගුලිමාල සූත්‍රය

(ම.නි. II, 516- 526 පිටු)

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වෙසෙන සමයක කොසොල් රටෙහි අංගුලිමාල නමැත්තා සිදුකළ මහත්වූ ව්‍යසනයත් බුදුරදුන් විසින් ඔහු එයින් මුදවා සුගමට ගත් ආකාරයත් කර්මය ඔහුට බලපෑ ආකාරයත් විස්තර කෙරෙන අනුශාසනය මජ්ඣිම නිකායෙහි අංගුලිමාල සූත්‍රය නමින් නම් කර තිබේ. එකල්හි අංගුලිමාල ලේ තැවරුණු අත් ඇතිව ගම් නිගම්ගම් ජනපදවලට මහත් හානියක් සිදු කරමින් මිනිසුන් ඝාතනය කරමින් ඇඟිලි මාලයක් දරමින් සිටි අවස්ථාවක බුදුරජාණන් වහන්සේ ඉමහත් කරුණාධ්‍යාශයෙන් අංගුලිමාල හමුවීමට ඔහු සිටි ප්‍රදේශය බලා වැඩම කළහ. මෙහි දී මග දෙපස රැස් ව සිටි ජනකාය බුදුරදුන්ට අනතුරැක් වේ ය යන හැඟීමෙන් ගමන වැළැක්වීමට යළි යළිත් මහත් වෙහෙසක් දැරූහ. මහාකරුණාවෙන් හා මහාප්‍රඥාවෙන් යුතු බුදුරජාණන් වහන්සේ මනා සිහිනුවණින් යුතුව ඉදිරියට වැඩම කළහ.

ඒ විට දසදෙනා, විසිදෙනා, තිස්දෙනා, හතලිස්දෙනා, පනස්දෙනා වශයෙන් සමූහ ලෙස පැමිණි අය ද අංගුලිමාලගේ ග්‍රහණයට හසු වී ඝාතනයට ලක් වූහ. බුදුරජාණන් වහන්සේ මෙලෙස තනිව තමන් සිටි ප්‍රදේශය කරා එනු දුටු අංගුලිමාල පුදුමයට පත් වූ අතර බුදුරදුන්ගේ දිවි තොර කොට තම ඇඟිලි මාලය සම්පූර්ණ කර ගැනීමට කල්පනා කළේ ය. ඒ අනුව තම ආයුධ අතැතිව වේගයෙන් බුදුරදුන් වෙත සමීප වීමට උත්සාහ කළ ද එය අපහසු විය. ඊට හේතුව බුදුරදුන් ඍද්ධිබලයෙන් අංගුලිමාලට ඉතා ඈතින් සංසුන් ගමනින් වඩිමින් ඔහු ළඟින් සිටින සේ පෙනීමට සැලැස්වීමයි. බුදුරදුන් වෙත ඉතා වේගයෙන් දිව ගිය ද උන්වහන්සේ වෙත ළඟා වීමට නොහැකි වූ අංගුලිමාල දිවීම නිසා මහත් වෙහෙසට පත් විය. වේගයෙන් දිව යන අශ්වයන්, ඇතුන් මෙන් ම වේගවත් රථ පිටුපස හබා ගොස් ඒවා ග්‍රහණය කර ගන්නා තමාට පියවි ගමනින් සංසුන් ව වඩනා බුදුරදුන් වෙත ළඟා වීමට නොහැකි වීම ගැන පුදුමයට පත් අංගුලිමාල **'මහණ නවතිනු, මහණ නවතිනු** *(තිට්ඨ සමණ, තිට්ඨ සමණ)*' යනුවෙන් හඬගා ප්‍රකාශ කළේ ය.

එවිට බුදුරජාණන් වහන්සේ **'අංගුලිමාල මම නැවතී සිටිමි, ඔබ නවතින්න'** යනුවෙන් සඳහන් කළහ. බුදුරදුන් මෙලෙස ගමන් කරමින් ම **'මම නැවතී සිටිමි'** යැයි ද නැවතී සිටින මට **'ඔබ නවතින්න'** යැයි ද කරන ප්‍රකාශය ගැන අංගුලිමාල කුතුහලයට පත් විය. ශ්‍රමණ භවත් ශාක්‍යපුත්‍ර වූ බුදුරදුන් කිසි කලෙකත් බොරු නොකියන බව ඔහු විශ්වාස කිරීම මෙම කුතුහලයට හේතුවයි. එබැවින් බුදුරදුන් මෙලෙස පැවැසීමෙහි හේතුව අංගුලිමාල විමසීය.

***'ගච්ඡං වදෙසි සමණ ඨිතොම්හි මමඤ්ච බ්‍රෑසි ඨිතං අට්ඨිතොති,***
***පුච්ඡාමි තං සමණ එතමත්‍ථං කථං ඨිතො ත්‍වං අහමට්ඨිතොම්හී'ති.'***

එවිට බුදුරදුන් ප්‍රකාශ කළේ තමන් වහන්සේ සියලු කල්හි සියලු සතුන් වෙත අවි ආයුධ බහා තබා ඇති හෙයින් තමන් නැවතී සිටින බවත් අඞ්ගුලිමාල සත්ත්වයන් වෙත අසංයත බැවින් සසර ගමන් කරන්නකු බවත් ය.

***'ඨිතො අහං අඞ්ගුලිමාල සබ්බදා සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං,***
***තුවඤ්ච පාණෙසු අසඤ්ඤතොසි තස්මා ඨිතොහං තුවමට්ඨිතොසී.'***

බුදුරජාණන් වහන්සේගේ මෙම ප්‍රකාශයත් සමග අඞ්ගුලිමාලට නුවණැස පහළ විය. අනුවණ අසත්පුරුෂයන්ගේ වැරදි මගපෙන්වීම නිසා නොමගට ගිය ද සසර භාවිත මනසක් තිබූ අංගුලිමාලට තමන් කරන මිනිස් සංහාරයෙහි සාවද්‍ය බව ක්ෂණිකව වැටහුණි. තමන් වෙත කරුණාවෙන් ම තමන් වරදින් මුදවන අටියෙන් මේ මහවනයට බුදුරදුන් වැඩි බව අඞ්ගුලිමාලට පසක් විය. දඬුමුගුරු

අත්හළ අංගුලිමාල බුදු සිරිපා මුල වැතිර වැඳ තමන් පැවිදි කරවන ලෙස අයැද සිටියේ ය. බුදුරජාණන් වහන්සේ ඒහි භික්ෂුභාවයෙන් අංගුලිමාල පැවිදි කරවා ඔහු සමග විහාරයට වැඩම කළහ.

මේ අතර කොසොල් රට ජනතාව රජ මාලිගාවට රැස් ව අංගුලිමාලගෙන් සිදුවන ව්‍යවසනයෙන් රටත් ජනතාවත් මුදා ගන්නා ලෙස කොසොල් රජුගෙන් ඉල්ලා සිටියහ, බලකර සිටියහ. ඊට ප්‍රතිචාර වශයෙන් කොසොල් මහරජතුමා අංගුලිමාල ජීවග්‍රාහයෙන් ගැනීම සඳහා පන්සියයක් අශ්ව සේනාව සහිත හේවායන් පිරිවරා අංගුලිමාල සිටි ප්‍රදේශය බලා නික්මුණහ. අතර මගදී බුදුරදුන් මුණ ගැසීමට තීරණය කළ රජතුමා බුදුරදුන් වැඩසිටි දෙව්රම් වෙහෙරට ගොස් බුදු සිරිපා වැඳ එකත් පසෙක ඉඳ ගත්තේ ය. එහි දී බුදුරදුන් රජතුමා මෙලෙස සේනා සහිතව කොහි යන්නේ දැයි ප්‍රශ්න කළහ. රජතුමාගේ පිළිතුර වූයේ ගම් නියම්ගම් ජනපද වනසන මිනිසුන් මරා ඇඟිලි මාලා කොට දරන ලේ තැවැරුණු අත් ඇති අංගුලිමාල නම් සොරා වැළැක්වීමට යන බවයි.

බුදුරදුන් මෙහිදී රජතුමාගෙන් ප්‍රශ්න කර සිටියේ එම අංගුලිමාල කෙස් රැවුල් බහා කහවත් දරා හැඳ පෙරව ගිහිගෙයින් නික්ම ප්‍රාණඝාත, සොරකම්, බොරුකීම් ආදියෙන් වැළකී බඹසර වෙසේ නම් ඔබ ඔහුට කුමක් කරන්නේ ද යනුවෙනි. ඊට රජතුමාගේ පිළිතුර වූයේ එවැනි තත්ත්වයක සිටින්නෙකුට තමා වැඳ නමස්කාර කිරීම්, හුනස්නෙන් නැඟී සිටීම්, සිව්පසයෙන් සැලකීම්, ධාර්මික රක්ෂාවරණ ආදිය සිදු කරන බවත් එහෙත් මෙබඳු සැහැසි දුසිල් තැනැත්තෙකුට එබඳු සීල සංවරයක් කොයින් වන්නේ ද යනුවෙනි. එවිට බුදුරජාණන් වහන්සේ නුදුරෙහි සිටි අංගුලිමාල තෙරණුවන් වෙත දකුණ'ත දිගු කොට **'මහරජ, අර සිටින්නේ අංගුලිමාල යැ'**යි ප්‍රකාශ කළහ. මෙලෙස ප්‍රකාශ කිරීමත් සමග කොසොල් රජු බියෙන් තැතිගෙන ලොමු දැහැ ගත්තේ ය. අංගුලිමාලගෙන් දැන් කිසිදු අනතුරක් සිදු නොවන බව බුදුරදුන් ප්‍රකාශ කළ විට රජුගේ බිය සංසිඳිණ. අනතුරුව අංගුලිමාල වෙත ගිය රජතුමා උන් වහන්සේට ගරුසරු දක්වා අංගුලිමාල තෙරුන්ගේ ගෝත්‍රය මව්පියන්ගේ නම් ආදිය විමසා ඔහු සැබෑ ම අංගුලිමාල බව ප්‍රත්‍යක්ෂ කළේ ය. (ගග්ගො බො මහාරාජ, පිතා, මන්තානී මාතාති) එවිට රජතුමා අංගුලිමාල තෙරුන්ට අවශ්‍ය සිව්පසය තමන් වෙතින් ලබා දෙන බව සඳහන් කළ ද තෙරුන්ගේ අදහස වූයේ ඒ සියල්ල මේ වන විට තමාට සම්පූර්ණ ව ඇති බවයි.

නැවත බුදුරදුන් වෙත ගිය කොසොල් රජතුමා තමන්ට දඬු මුගුරු අවි ආයුධවලින් වුව ද දමනය කිරීමට නොහැකි සැඩපරුෂ පුද්ගලයන් බුදුරජාණන් වහන්සේ ඒ කිසිදු දණ්ඩනයකින් තොරව දමනය කිරීම පිළිබඳව බලවත් ප්‍රසාදය ප්‍රකාශ කර බුදුරදුන්ගේ ගුණ වර්ණනා කොට නික්ම ගියේ ය.

මේ අතර දිනක් පෙරවරුවෙහි අංගුලිමාල තෙරණුවෝ හැඳ පෙරව පා සිවුරු ගෙන පිණ්ඩපාතය පිණිස සැවැත් නුවරට වැඩම කළහ. එහි දී ගැබ්බරව මූඪගර්භව වේදනාවට පත් ව සිටි කාන්තාවක දැක 'භවත්නි, සත්ත්වයෝ ඒකාන්තයෙන් කෙලෙසෙති' යන සිතිවිල්ලක් ඇති විය. පිණ්ඩපාතය ගොස් පෙරළා විහාරයට වැඩම කළ අංගුලිමාල තෙරණුවෝ මෙම සිදුවීම බුදුරදුන් වෙත ප්‍රකාශ කළහ. එවිට බුදුරදුන් අංගුලිමාල තෙරණුවන්ට ප්‍රකාශ කර සිටියේ 'අංගුලිමාල, ඔබ එම කාන්තාව වෙත නැවත ගොස් මෙසේ කියන්න'. *'නැගෙණියෙනි, මම උපන් තැන් පටන් දැන දැන සතකුගේ දිවි තොර කළ බවක් නොදනිමි. එම සත්‍යානුභාවයෙන් නුඹට සෙත් වේවා. ඔබගේ ගැබටත් සෙත් වේවා'* (***යතෝ'හං භගිනි ජාතෝ නාභිජානාමි සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙතා. තේන සච්චේන සොත්ථි තේ හෝතු සොත්ථි ගබ්භස්සා'ති***) කියා ය. මෙහි දී අංගුලිමාල තෙරණුවන් ප්‍රකාශ කර සිටියේ ස්වාමීනි, මම දැන දැන බොහෝ සත්ත්වයන්ගේ ජීවිත තොර කළ හෙයින් කෙසේ නම් මම මෙබඳු සත්‍ය ක්‍රියාවක් කරන්නේ ද යනුවෙනි. එවිට බුදුරදුන් සඳහන් කළේ, එසේ නම් අංගුලිමාල **'ඔබ ආර්ය ජාතියට පැමිණි තැන් පටන් කිසිදු සත්ත්වයකුගේ දිවි තොර නොකළ සත්‍ය බලයෙන්'** සත්‍ය ක්‍රියා කරන ලෙසයි (***යතො'හං භගිනි අරියාය ජාතියා ජාතො නාභිජානාමි***

***සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙතා. තෙන සච්චේන සොත්ථි තෙ හොතු සොත්ථි ගබ්භස්සා'ති***). බුදුරදුන්ගේ උපදෙස් පරිදි එම කාන්තාව වෙත යළිත් වැඩම කළ අංගුලිමාල තෙරණුවෝ එම සත්‍ය ක්‍රියාව ඇය අබියස සඳහන් කළ අතර එයින් එම කාන්තාවට ද ගැබට ද සෙත්විය. පසුකාලීනව මෙය අංගුලිමාල පිරිත නමින් ප්‍රකට ව ගැබ්බරව සිටි කාන්තාවන් විශාල පිරිසකට ශාන්තිය සලසන සෙත් පිරිතක් ලෙස සියවස් විසිහයකට අධික කාලයක් ලොවට ශාන්තිය සැලසී ය.

නොබෝ කලකින් අංගුලිමාල තෙරණුවෝ අප්‍රමාදීව දහමෙහි හැසිර සියලු කෙලෙසුන් නසා රහත් ඵලයට පත් වූහ. රහත් බවට පත් උන්වහන්සේ පිණ්ඩපාතය වැඩි බොහෝ අවස්ථාවන්හි දී අන් අයගේ ගල් මුල් පහරවලට ලක්වූහ. වෙනත් දෙසට විසි කරන ගල්මුල් පවා පැමිණ අංගුලිමාල තෙරණුවන්ගේ ඇග ගැටී හිස, කය, සිවුරු, පාත්‍ර ආදියට හානි පැමිණ ලේ වැගිරුණු හිසින් කයින් යුතුව බොහෝ අවස්ථාවල යළි වෙහෙරට වැඩම කළහ. එවිට බුදුරදුන් ප්‍රකාශ කළේ 'අංගුලිමාල ඔබ ඉවසන්න. වසර සිය දහස් ලක්ෂ ගණනක් නිරයෙහි පැහීමට හේතු වන්නාවූ කර්මයන්හි විපාක මෙලොව දීම විඳුනාහ' යනුවෙනි. මේ අතර විවේකීව ඵලසමවත් සුවය විඳ ඉන් නැගී සිට මෙලෙස සතුටු සිතින් උදම් ඇනූහ.

***'යෝ ච පුබ්බේ පමජ්ජිත්වා පච්ඡා සො නප්පමජ්ජති,***
***සෝ ඉමං ලොකං පභාසෙති අබ්භා මුත්තො'ව චන්දිමා'***

(යමෙක් පළමුව ප්‍රමාදව සිට පසුව අප්‍රමාදී වෙත් ද, ඔහු වළාගැබින් මිදි සඳ මඩල සේ මෙලොව බබුළුවන්නේ ය.)

***'යස්ස පාපං කතං කම්මං කුසලෙන පිථීයති,***
***සෝ ඉමං ලොකං පභාසෙති අබ්භා මුත්තො'ව චන්දිමා'.***

(යමකු විසින් කරන ලද පාප කර්මය කුසලයෙන් වසාලනු ලැබේ ද, ඔහු වළා ගැබින් මිදි සඳ මඩල සේ මෙලොව බබුළුවන්නේ ය.)

***'යෝ හවෙ දහරො භික්ඛු යුඤ්ජති බුද්ධසාසනෙ,***
***සෝ ඉමං ලොක පභාසෙති අබ්භා මුත්තො'ව චන්දිමා'.***

(යම් තරුණ භික්ෂුවක් බුද්ධශාසනයෙහි අප්‍රමාදීව පිළිවෙත් පුරා ද, ඔහු වළා ගැබින් මිදි සඳ මඩල සේ මෙලොව බබුළුවන්නේ ය.)

***'දිසා හි මෙ ධම්මකථං සුනන්තු දිසා හි මෙ යුඤ්ජන්තු බුද්ධසාසනෙ,***
***දිසා හි මෙ තෙ මනුජෙ භජන්තු යෙ ධම්මමෙවාදපයන්ති සන්තො'.***

(මාගේ සතුරෝ ද ධර්මය අසත්වා. මාගේ සතුරෝ ද බුද්ධශාසනයෙහි හැසිරෙත්වා. යම් සත්පුරුෂ කෙනෙක් ධර්මය සමාදන් කරවත් ද මාගේ සතුරෝ එබඳු උතුම් මිනිසුන් ඇසුරු කෙරෙත්වා)

***'දිසා හි මෙ ඛන්තිවාදානං අවිරොධප්පසංසිනං,***
***සුණන්තු ධම්මං කාලෙන තඤ්ච අනුවිධීයන්තු'.***

(මාගේ සතුරෝ මෙත්ගුණ ඉවසීම පසස්නා වූ බුදුරදුන්ගේ ධර්මය සුදුසු කල්හි අසත්වා. ඒ අනුව පිළිවෙත් පුරත්වා.)

***'න හි ජාතු සො මමං හිංසෙ අඤ්ඤං වා පන කඤ්චනං,***
***පප්පුය්‍ය පරමං සන්තිං රක්ඛෙය්‍ය තසථාවරෙ'.***

(මාගේ සතුරෝ මට හිංසා නොකෙරෙත්වා. අන් කිසිවෙකුට ද හිංසා නොකෙරෙත්වා. උතුම් නිවනට පැමිණ තෘෂ්ණා සහිත වූවන් මෙන් ම තෘෂ්ණා රහිත වූවන් ද රකිත්වා.)

*'උදකං හි නයන්ති නෙත්තිකා උසුකාරා නමයන්ති තෙජනං,*
*දාරුං නමයන්ති තච්ඡකා අත්තානං දමයන්ති පණ්ඩිතා'.*

(ජලය ගෙන යන්නෝ දිය නිසි තැනට ගෙන යෙත්වා. ඊ වඩුවෝ ඊ කැමැති සේ ඍජු කෙරෙත්. වඩුවෝ දැව තමන් කැමැති සේ නමත්. නුවණැත්තෝ තම සිත රකිත්.)

*'දණ්ඩෙනෙකෙ දමයන්ති අංකුසෙහි කසාහි ච,*
*අදණ්ඩෙන අසත්ථෙන අහං දන්තො'ම්හි තාදිනා'.*

(ඇතැමෙක් දණ්ඩයෙන් ද අංකුසයෙන් ද කසවලින් ද දමනය කෙරෙති. බුදුරදුන් විසින් අදණ්ඩයෙන් අසත්‍ථයෙන් මම දමනය කරන ලද්දෙමි.)

*'අහිංසකොති මෙ නාමං හිංසකස්ස පුරෙ සතො,*
*අජ්ජාහං සච්චනාමොම්හි න නං හිංසාමි කඤ්චනං'.*

(පෙර හිංසක වූ මට අහිංසක යන නම විය. දැන් මම සත්‍ය වූ අහිංසක වෙමි. ඒ කිසිවකු නොපෙළමි.)

*'චොරො අහං පුරෙ ආසිං අංගුලිමාලොති විස්සුතො,*
*වුය්හමානො මහොඝෙන බුද්ධං සරණමාගමං'.*

(පෙර මම අංගුලිමාල නම් ප්‍රසිද්ධ සොරා වූයෙමි. අවිද්‍යාව නමැති මහගංවතුරින් ගසාගෙන ගියේ බුදුන් සරණ ගියෙමි.)

*'ලොහිතපාණි පුරෙ ආසිං අංගුලිමාලොති විස්සුතො,*
*සරණාගමනං පස්ස භවනෙත්ති සමූහතා'.*

(පෙර මම අංගුලිමාල යැයි ප්‍රකට ව ලේ තැවැරුණු ඇතැතිව සිටියෙමි. සරණාගමන ඵලය දෙස බලන්න. මවිසින් සසර රැහැන නස්නා ලදි.)

*'තාදිසං කම්මං කත්වාන බහුං දුග්ගතිගාමිනං,*
*ඵුට්ඨො කම්මවිපාකෙන අනණො භුඤ්ජාමි භොජනං'*

(දුගතියට යන සුලු එබඳු බොහෝ කර්ම කොට මගඵල විපාක වශයෙන් පහස්නා ලද්දෙමි ණය නැති ව බොදුන් වළඳමි.)

*'පමාදමනුයුඤ්ජන්ති බාලා දුම්මෙධිනො ජනා,*
*අප්පමාදඤ්ච මේධාවී ධනං සෙට්ඨං'ව රක්ඛති'.*

(අනුවණ බාල ජනයෝ ප්‍රමාදයෙහි යෙදෙති. නුවණැත්තා අප්‍රමාදී බව ශ්‍රේෂ්ඨ ධනයක් මෙන් රකියි.)

*'මා පමාදමනුඤ්ජෙථ මා කාමරතිසන්ථවං,*
*අප්පමත්තො හි ඣායන්තො පප්පොති විපුලං සුඛං'*

(ප්‍රමාද නොවන්න. කම්සැපයෙහි ගිජු නොවන්න. අප්‍රමාදීව ධ්‍යාන වඩන්නා මහත් වූ සැපයට පත්වේ ද එහෙයිනි.)

*'සාගතං නාපගතං නයිදං දුම්මන්තිතං මම,*
*සංවිභත්තෙසු ධම්මෙසු යං සෙට්ඨං තදුපාගමං.'*

( මාගේ මේ සසුනට පැමිණීම මනා ඊමකි. එය නොමනා ඊමක් නොවේ. නපුරු කොට සිතන ලද නොවේ. බෙදා දක්වන ලද ධර්මයන් අතුරෙහි යම් ශ්‍රේෂ්ඨ ධර්මයක් ඇත් ද ඒ නිවනට පැමිණියෙමි.)

***'සාගතං නාපගතං නයිදං දුම්මන්තං මම,***
***තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්සසාසනන්ති.'***

(මාගේ මේ සසුනට පැමිණීම මනා ඊමකි. එය නොමනා ඊමක් නොවේ. නපුරු කොට සිතන ලද නොවේ. ත්‍රිවිද්‍යාවට පත්වූයෙම් බුද්ධශාසනය කරන ලද්දෙමි.)

අංගුලිමාලි සූත්‍රයෙහි ප්‍රධාන වශයෙන් විස්තර වන්නේ කර්මය කර්මඵල පිළිබඳවයි. එබැවින් ඊට අදාළව බුදුදහමේ එන කරුණු සාකච්ඡා කිරීම මෙහිලා වඩාත් වැදගත් වේ. ඒ ඒ කර්මයන් පිළිබඳවත් එම කර්මයන්ට අදාළව සත්ත්වයන් උපත ලද නොයෙක් භවයන් පිළිබඳවත් පැහැදිලි ප්‍රත්‍යක්ෂ අවබෝධයක් සහිත ව සිටි බුදුරජාණන් වහන්සේ ලෝකයා කෙරෙහි අපරිමිත කරුණාවෙන් ඒ පිළිබඳව දේශනා කළ සේක. එසේ වුව ද 'කර්මය' යන තේමාව අචින්තනීය විෂයයක් බැවින් ඒ පිළිබඳ සම්පූර්ණ අවබෝධයක් ලැබීම දුෂ්කර කටයුත්තකි. එසේ වුව ද කර්මය නිතර සිහි කළ යුතු මාතෘකාවක් ලෙස බුදුදහමෙහි ඇගයීමට ලක් ව තිබේ.

කර්මය යන්නෙහි සාමාන්‍ය සරල අර්ථය යමක් කිරීම යන්නයි. බුදුදහමට අනුව යමක් කර්මයක් බවට පත් වන්නේ සිතින් සිතා කයින් වචනයෙන් සිතින් එය සිදු කිරීමෙනි (***චෙතනාහං භික්ඛවෙ කම්මං වදාමි, චෙතයිත්වා කම්මං කරොති කායෙන වාචාය මනසා,*** නිබ්බේධික සුත්ත, අං.නි. vi, 208 පිට). කර්මය වූ කලී ආධ්‍යාත්මික ශක්ති විශේෂයකි. කර්ම අදෘශ්‍යමාන නමුදු ඉන් ජනිත වන කර්මඵලය දෘශ්‍යමාන වූවකි. කර්මයට අදාළ වූ චේතනාව පටිච්චසමුප්පන්න වූ චෛතසික ධර්මයකි. එය ස්පර්ශ, වේදනා, සංඥා, මනසිකාර, චිත්ත සමග සම්බන්ධිත වූ ධර්මයකි. යමක් කර්මයක් බවට පත්වන්නේ එය සචේතනාත්මක ව කිරීමෙනි. එසේ නොවුණු විට පුණ්‍ය පාප සිදු නොවේ (***නත්ථි පාපං අකුප්පතො***). කුසල - අකුසල වශයෙන් කර්මය දෙවැදෑරුම් වන අතර ඊට අමතරව බුදුදහමෙහි සූත්‍ර පිටකයෙහි සුකට - දුක්කට, සෙවිතබ්බ - අසෙවිතබ්බ, සුක්කධම්ම - කණ්හධම්ම, පුඤ්ඤ - පාප, භබ්බ - අභබ්බ යන පද ව්‍යවහාර වේ. මෙහිලා කුසල යනු තමාටත් අනුන්ටත් යහපත හිතසුව පිණිස පවත්නා ක්‍රියා ය. අකුසල යනු තමාටත් අනුන්ටත් අයහපත අවැඩ පිණිස පවත්නා ක්‍රියා ය.

සර්වඥතා ඥානය සාක්ෂාත් කිරීමත් සමග ලැබුණු **චුතූපපාත ඤාණය** මගින් සත්ත්වයා කර්මානුරූපව යළි භවයක ප්‍රතිසන්ධිය ලබන ආකාරය පිළිබඳව බුදුරජාණන් වහන්සේට පැහැදිලිව අවබෝධ විය. ගෙවල් දෙකක් අතර සිටින ඇස් ඇති පුරුෂයකුට එක් නිවසකින් නික්ම තවත් නිවසකට පිවිසෙන තැනැත්තකු මැනැවින් දර්ශනය වන්නාක් මෙන් බුදුරජාණන් වහන්සේට සත්ත්වයන් එක් භවයකින් ච්‍යුත වී නැවත භවයක ප්‍රතිසන්ධි ලබන ආකාරය මැනැවින් ප්‍රත්‍යක්ෂ විය. එහි දී උපදින සත්ත්වයන් බොහෝ දෙනකු දුගතිගාමී වන අයුරු දැක ලෝක සත්ත්වයා කෙරෙහි බලවත් සංවේගයක් හටගත් බුදුරජාණන් වහන්සේ මේ තත්ත්වය ලෝකයාට අවබෝධ කරලීමට ඉමහත් වෙහෙසක් දරමින් ධර්ම දේශනා කළහ. උන් වහන්සේගේ මූලික අපේක්ෂාව වූයේ ස්වර්ග මාර්ගය හා මෝක්ෂ මාර්ගය ලොවට දේශනා කිරීමයි. එහිලා පෘථග්ජනයන් සේඛයන් කරලීමත් සේඛයන් අසේඛයන් (රහත්බවට පත්) කිරීමත්, අසේඛයන් (රහත් වූවන්) පිරිනිවන තෙක් සුවසේ වෙසෙනු දැකීමත් බුදුරදුන්ගේ අපේක්ෂාව විය. මේ සඳහා අපාගත වීමට සිටියවුන්ට කම්මස්සකතා සම්මා දිට්ඨිය ලබා දී ඔවුන් සුගතියෙහි පිහිටුවීමට ද **'කම්මස්සකතා සම්මාදිට්ඨිය'** ලැබූවන්ට **'චතුසච්ච (අරිය) සම්මා දිට්ඨිය'** ලබා දී ඔවුන් නිවනෙහි හික්මවීමට ද අනුශාසනා කළහ. බුදුරජාණන් වහන්සේ ලොව පහළ වන සමය වන විට ද ඇතැමුන් යළි ඉපදීම හා කර්මය පිළිබඳ විශ්වාස කොට තිබුණ ද ඔවුන් එය විශ්වාස කළේ ශාශ්වත දෘෂ්ටිය මත පිහිටා ය. බුදුදහමෙහි පවත්නා විශේෂත්වය වන්නේ ශාශ්වත හා උච්ඡේද යන දෘෂ්ටි දෙකෙහි ම නොපිහිටා පටිච්ච සමුප්පාදය හෙවත් හේතුඵල

දහම මත පදනම් ව කර්මය විග්‍රහ කිරීමයි. එය ලොව වෙනත් කිසිදු ආගමක හෝ දර්ශනයක නොමැති බුදුදහමට පමණක් සුවිශේෂී වූ විග්‍රහයකි.

කර්මය හා ඉන් ජනිත වන ඵලය පිළිබඳව පරතෙරට සිතා අවසන් කළ නොහැක. එබැවින් කර්ම සංකල්පය වූ කලි අචින්තනීය වූවක් බව සඳහන් වේ (අචින්තෙය්‍ය සුත්ත, අ.නි.). රහත් උතුමකුට වුව ද කර්මය පිරිසිඳ දත නොහැක. එය සම්මා සම්බුදුවරයකුට ම විෂයය වූවකි. එසේ වුව ද තමා කර්මය ස්වකීය කොට ඇත්තෙක්, කර්මය දායාද කොට ඇත්තෙක්, කර්මය ජනිත කොට ඇත්තෙක්, කර්මය ඥාති කොට ඇත්තෙක්, කර්මය පිළිසරණ කොට ඇත්තෙක් බවත් යහපත් වූ හෝ අයහපත් වූ හෝ යම් කර්මයක් කරයි ද එය දායාද කොට ඇත්තෙක් බවත් ගිහි පැවිදි සැවො ම නිතර සිහි කළ යුතු බව අභිණ්හ පච්චවෙක්ඛණ සූත්‍රයෙහි සඳහන් වේ (***කම්මස්සකොම්හි කම්මදායාදො කම්මයොනි කම්මබන්ධු කම්මපටිසරණො යං කම්මං කරිස්සාමි කල්‍යාණං වා පාපකං වා තස්ස දායාදො භවිස්සාමීති අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං....,*** අභිණ්හපච්චවෙක්ඛණ සුත්ත, අං.නි. iii).

මජ්ඣිම නිකායේ චූල්ලකම්මවිභංග සූත්‍රයට අනුව දිනක් බුදුරදුන් වෙත පැමිණි තොදෙය්‍ය පුත්ත සුභ මානවකයා අල්පායුක - දීඝායුක, බව්හාබාධ - අප්පාබාධ, දුබ්බණ්ණ - වණ්ණවන්ත, අප්පසක්ක - මහෙසක්ක, අප්පභොග - මහාභොග, නීචකුලීන - උච්චකුලීන, දුප්පඤ්ඤ - පඤ්ඤවන්ත වශයෙන් ලොව මිනිසුන් අතර පවත්නා වෙනසට හේතු විමසී ය. ඊට බුදුරදුන්ගේ පිළිතුර වූයේ මෙම උස් පහත් භේදයට හේතුව කර්මය බවත් කර්මය සත්ත්වයා හීන ප්‍රණීත වශයෙන් බෙදා ඇති බවත් ය (***කම්මස්සකා මානව, සත්තා කම්මදායාදා, කම්මයොනි කම්මබන්ධු කම්මපටිසරණා. කම්මං සත්තෙ විභජති යදිදං හීනප්පණීතතා,*** ම.නි. iii, චූල්ලකම්මවිභංග සුත්ත, 432 පිට). අනතුරුව එම වෙනස්කම්වලට හේතු සවිස්තරාත්මකව විස්තර කළහ. ඒ අනුව,

- ▲ ප්‍රාණඝාතය හේතුවෙන් ආයුෂ අඩු වන බව ද
- ▲ ප්‍රාණඝාතයෙන් වැළකීමෙන් ආයුෂ වැඩි වන බව ද
- ▲ සතුන්ට හිංසා කිරීමෙන් බොහෝ ආබාධ ඇති වන බව ද
- ▲ සතුන්ට හිංසා කිරීමෙන් වැළකීමෙන් ආබාධ අඩු වන බව ද
- ▲ ක්‍රෝධය බහුල වීමෙන් දුර්වර්ණ වන බව ද
- ▲ ක්‍රෝධ නොකිරීමෙන් ප්‍රියජනක (වර්ණවත්) වන බව ද
- ▲ ඊර්ෂ්‍යාව හේතුවෙන් අල්පේශාක්‍ය වන බව ද
- ▲ ඊර්ෂ්‍යා නොකිරීමෙන් මහේශාක්‍ය වන බව ද
- ▲ දන් නොදීම හේතුවෙන් අල්පභෝග වන බව ද
- ▲ දන් දීම හේතුවෙන් මහාභෝග වන බව ද
- ▲ මානාධික වීමෙන් පහත් කුලයන්හි උපත සිදු වන බව ද
- ▲ මානාධික නොවීමෙන් උසස් කුලයන්හි උපත සිදු වන බව ද
- ▲ විමසා බලා ක්‍රියා නොකිරීමෙන් නුවණ මද වන බව ද
- ▲ විමසා බලා ක්‍රියා කිරීමෙන් නුවණ ඇති වන බව ද

සඳහන් කර ඇත.

මෙලෙස සත්ත්වයාගේ ජීවන ක්‍රියාවලියට කර්මය සුවිශේෂී බලපෑමක් සිදු කරන නමුදු කර්මයෙන් සියල්ල සිදුවේ ය යන්නක් බුදුදහමින් නොකියැවේ. එහි දී ලෝකයේ සජීවී - අජීවී සියල්ල සිදුවන නියාම ධර්ම පහක් හඳුන්වා දී ඇත. එනම් උතු නියාම, බීජ නියාම, කම්ම නියාම, ධම්ම නියාම, චිත්ත නියාම වශයෙනි. කර්මය යනු මෙම නියාම ධර්ම පහෙන් එකක් පමණි. තවද සත්ත්වයන්ට සැපදුක් අත්විඳීමට හේතු අටක් පිළිබඳව සංයුක්ත නිකායෙහි මොළිය සීවක සූත්‍රයෙහි (සං.නි. iv, 436 පිට) දක්වේ. එනම්ඃ වාතය, පිත, සෙම, සන්නිපාතය (තුන්දොස් එක්වීම), ඍතු

වෙනස්වීම, විෂම හැසිරීම, උපක්‍රම, බලවත් අකුසල කර්මයන්හි විපාක වශයෙනි. මෙම හේතු අට අතුරින් සැපදුක් ජනිත වීමට හේතුවන කරුණක් ලෙස කර්මය දක්වා ඇති අතර එය එක ම හේතුව නොව එක් හේතුවක් පමණක් බව ද වටහා ගත යුතුව ඇත. ගිරිමානන්ද සූත්‍රයෙහි (අ.නි. vi, 198 පිට) රෝග හටගැනීමට හේතු වශයෙන් ද මෙම කරුණු අට එලෙසින් ම දක්වේ. එයින් ද පැහැදිලි වන්නේ රෝගපීඩා ඇතිවීමට බලපාන කරුණු අතර කර්මය එක් කරුණක් පමණක් බවයි.

කර්මය තෙවැදෑරුම් වශයෙන් බුදුසමයෙහි විස්තර වේ. එනම් කාය කර්ම, වචී කර්ම හා මනෝ කර්ම වශයෙනි. බුදුරදුන් සමයෙහි ඇතැම් ආගම්වල මෙය කාය දණ්ඩ, වචී දණ්ඩ මනෝ දණ්ඩ වශයෙන් විග්‍රහය කොට තිබුණි. බුදුරජාණන් වහන්සේ **'දණ්ඩ'** යන්න බැහැර කොට ඒ වෙනුවට '**කම්ම**' (කර්ම) යන්න හඳුන්වා දුන් අතර මෙම කර්මත්‍රය අතුරින් මනෝ කර්මය වඩාත් ප්‍රබල බව දීඝතපස්සී නම් ජෛන තැනැත්තාට දේශනා කළහ (ඉමෙසං ඛො තපස්සී තිණ්ණං කම්මානං........ මනොකම්මං මහාසාවජ්ජතරං පඤ්ඤාපෙමි පාපස්ස කම්මස්ස කිරියාය පාපස්ස කම්මස්ස පවත්තනතියා, නො තථා කායකම්මං නො තථා වචීකම්මං, ම.නි.i). ඇතැම් කායික හා වාචසික ක්‍රියාවන්ට වඩා මනෝ කර්මය බලවත් බවත් එහි ප්‍රතිඵල වශයෙන් ඇතැමුන් ලොවට මහත් අනර්ථයන් සිදු කළ බවත් ධර්මයෙහි දැක්වේ. තව ද සත්ත්වයා සිදු කරන සියලු ක්‍රියාවන්ට මනස ප්‍රධාන වන බව ද අවධාරණය කොට තිබේ. ප්‍රදුෂ්ඨ වූ සිතින් යුතු ව කරන ක්‍රියා හා කතා තුළින් ගොනා පිටුපස එන රිය සක මෙන් (***චක්කං'ව වහතො පදං***) සත්ත්වයාට දුක් විඳීමට සිදු වන බවත්, ප්‍රසන්න සිතින් යුතු ව කරන ක්‍රියා හා කතා තුළින් තමා පිටුපස එන ඡායාව මෙන් (***ඡායා'ව අනපායිනී)*** සත්ත්වයාට සැප විඳීමට හැකි වන බවත් ධම්මපදයෙහි සඳහන් වේ (ධ.ප. යමක වග්ග, 1-2 ගාථා).

තවද අහසෙහි සිටියත් මුහුද මැද සිටියත් පර්වත කුහරයක සිටියත් ලොව කොතැන සිටියත් කර්මයෙන් ලැබෙන විපාකයෙන් නොමිදිය හැකි බව සඳහන් වේ.

***න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ න පබ්බතානං විවරං පවිස්ස,***
***න විජ්ජති සො ජගතිප්පදෙසෙ යත්ථට්ඨිතං මුඤ්චෙය්‍ය පාපකම්මා.*** (ධ.ප.)

බුදුදහමෙහි සඳහන් බොහෝ ඉගැන්වීම්වලට කර්මය ඇතුළත් ව තිබේ. ඒ අතර පුනර්භවය, පටිච්චසමුප්පාදය, ස්කන්ධ විග්‍රහය, කුසල අකුසල විග්‍රහය, නාම රූප, සතර ආහාර, ආයතන, ආර්ය අෂ්ටාංගික මාර්ගය, චතුරාර්ය සත්‍යය, නිවන ප්‍රධාන ය. පුනර්භවයට හේතුවන ප්‍රතිසන්ධි චිත්තය සමග කර්මය සම්බන්ධ ව පවතී. පටිච්චසමුප්පාදයෙහි සංඛාර නමින් දැක්වෙන්නේ කර්මයයි. ඊට අනුව සත්ත්වයා කර්ම සිදුකරන්නේ අවිද්‍යාව නිසයි. පංචඋපාදානස්කන්ධ විග්‍රහයෙහි සංඛාර ස්කන්ධයට කර්මය ඇතුළත් වේ. 'කුසල - අකුසල' සත්ත්වයා විසින් සිදු කරනු ලබන කර්මය දෙකට බෙදා තිබේ. නාම රූප විග්‍රහයෙහි ලා එය නාම යටතට ඇතුළත් වේ. සතර ආහාරයෙහිලා මනො සංචේතනාහාරය යටතට ගැනේ. ආයතන විග්‍රහයෙහි ලා බාහිර ආයතන වන රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම ඇසුරින් සංචේතනය ක්‍රියාත්මක වේ. ආර්ය අෂ්ටාංගික මාර්ගය වූ කලි කර්මක්ෂය කිරීමේ ආර්ය මාර්ගයයි. එහි සම්මා දිට්ඨියෙහි විශේෂයෙන් කර්මය පිළිබඳ ව දැක්වේ. සම්මාදිට්ඨිය වූ කලි දෙවැදෑරුම් ය. එනම් සාශ්‍රව වූ පුණ්‍යාභාගීය සංඛ්‍යාත කර්මඵල ඇදහීම පිළිබඳ ලෞකික සම්මා දිට්ඨිය හා චතුසච්ච සම්මාදිට්ඨි නම් වූ ලෝකෝත්තර සම්මා දිට්ඨියයි. මින් පළමුවැන්නෙන් කියැවෙන්නේ කර්මස්සකතා සම්මාදිට්ඨියයි. එනම්, දුන් දෙයෙහි විපාක ඇත, යාගයෙහි විපාක ඇත..., ආදී වශයෙන් දැක්වෙන කර්මඵල විශ්වාස කිරීම් වශයෙන් පවත්නා සම්මාදිට්ඨිය මීට අයත් ය.

සත්ත්වයා මිථ්‍යා දෘෂ්ටියෙන් මුදවා සම්මා දිට්ඨියෙහි පිහිටුවාලීම සඳහා බුදුදහම නිබඳ ව අනුශාසනා කරනු දක්නට ලැබේ. ඒ සඳහා දේශිත අනුශාසනා පෙළ දහමෙහි නිතර හමුවේ. යහපත කරන්නාට යහපත් ප්‍රතිඵල ද, අයහපත කරන්නාට අයහපත් ප්‍රතිඵල ද අත්විඳීමට සිදුවන බව

බුදුසමය අවධාරණය කරයි (***කල්‍යාණකාරී කල්‍යාණං - පාපකාරී ච පාපකං,*** ඉසයොසමුද්දක සූත්‍රය, සං.නි.i, 404 පිට). වපුරන්නේ යම් බීජයක් ද ඵල වශයෙන් ලැබෙන්නේ ඊට සමාන ඵලයි. එමෙන් ම කරන කර්මයන්ට අනුරූප ව ප්‍රතිඵල ලැබේ (**යාදිසං වපතෙ බීජං - තාදිසං හරතෙ ඵලං).** තවද කර්මය නිසා ලෝකය පවත්නා බවත් කර්මය නිසා ප්‍රජාව ජීවත් වන බවත් ගමන් කරන රථයක රෝදය නොගැළවී තබන කඩ ඇණය ලෙසින් සත්ත්වයා කර්මයට බැඳී පවත්නා බව ද සඳහන් වේ.

***කම්මනා වත්තති ලොකො - කම්මනා වත්තතී පජා,***
***කම්මනිබන්ධනා සත්තා - රථස්සානීව යායතො.***
(සු.නි. වාසෙට්ඨ සුත්ත, 657 ගාථාව)

මෙබඳු තත්ත්වයක් මත කයින්, වදනින්, සිතින් කර්ම කිරීමේ දී යළි යළිත් නුවණින් විමසා බලා එය සිදු කරන ලෙස පෙළ දහමෙහි නිතර අවධාරණය කර ඇත (අම්බලට්ඨික රාහුලොවාද සුත්ත, ම.නි. ii, 132 පිටුව). එහි දී යහපතෙහි යෙදෙන ලෙසත් අයහපතින් මිදෙන ලෙසත් දක්වේ (***අභිත්ථරෙථ කල්‍යාණෙ - පාපා චිත්තං නිවාරයෙ***). දරුවන් හදන දෙමාපියන් විසින් දරුවනට සිදු කළ යුතු යුතුකම් අතර ද පළමුවෙන් ම සඳහන් වන්නේ තම දරුවන් පාපයෙන් මුදවා යහපතෙහි යොදවන ලෙසයි (***පාපා නිවාරෙන්ති, කල්‍යාණෙ නිවෙසෙන්ති***, සිගාල සුත්ත, දී.නි.).

අයහපතින් මිදීම හා යහපතෙහි යෙදීම සඳහා වූ මෙම අනුශාසනාව වූ කලී අප ගෞතම බුදුරදුන්ගේ පමණක් නොව ලොව පහළ වන සියලු බුදුවරුන්ගේ අනුශානාවයි.

***සබ්බපාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා,***
***සචිත්තපරියොදපනං - එතං බුද්ධානසාසනං.*** (ධ.ප.)

යමකු වසලයකු හෝ බ්‍රාහ්මණයකු වීමට බලපාන ප්‍රධාන සාධක වනුයේ ඔහු විසින් කරනු ලබන කර්මයේ ස්වභාවයයි.

***න ජච්චා වසලො හොති - න ජච්චා හොති බ්‍රාහ්මණො,***
***කම්මනා වසලො හොති - කම්මනා හොති බ්‍රාහ්මණො.***
(සු.නි., 653 ගා., වසල සුත්ත)

යමකු පෙර පින් කර ඇති බව (***පුබ්බෙ ච කතපුඤ්ඤතා,*** සු.නි. මංගල සුත්ත) දෙලොව අභිවෘද්ධිදායී මංගල කරුණක් ලෙස දක්වේ. මෙබඳු ස්වභාවයෙන් යුතු කර්මයට සුළු වූවකැයි අවමන් නොකරන ලෙස (***මාවමඤ්ඤෙථ පුඤ්ඤස්ස න මං තං ආගමිස්සති***) ද බුදුසමය අවධාරණය කරයි. පාප කර්ම ඉන් මිදී සැඟවිය හැකි තැනක් මිහිපිට කිසිදු තැනක නැති බව සඳහන් වේ (*න විජ්ජති සො ජගතිප්පදෙසො යත්ථට්ඨිතො මුඤ්චෙය්‍ය පාපකම්මා,* ධ.ප. 127 ගාථාව).

විපාකයන්හි ස්වභාවය අනුව කර්මය කොටස් හතරකට බෙදේ. එනම්,

**1. කණ්හං කණ්හවිපාකං**
කළු විපාක ඇති කළු කර්ම - (සතර අපායන්හි දුක් විඳීමට හේතුවන කර්ම)

**2. සුක්කං සුක්කවිපාකං**
සුදුවිපාක ඇති සුදු කර්ම - (සදෙව් ලොව, බඹලොව ඉපදීමට හේතුවන කර්ම)

**3. කණ්හසුක්කං කණ්හසුක්කවිපාකං**
කළු සහ සුදු යන මිශ්‍ර විපාක ජනිතවන කර්ම (මිනිස් ලොව ඉපදීමට හේතුවන කර්ම)

**4. අකණ්හඅසුක්කං අකණ්හඅසුක්කවිපාකං**

කළු ද නොවූ සුදු ද නොවූ විපාක දෙන කළු ද නොවූ සුදු ද නොවූ කර්ම
(නිවන සඳහා හේතු වන කර්ම)

1. කළු විපාක ඇති කළු කර්ම යනු ප්‍රාණඝාතාදි දස අකුසලයෙන් යුතුව සපුරා අකුසලයට බර වූ ජීවිතයක් ගත කිරීමයි. නිරතුරුව ලෝභ, ද්වේෂ, මෝහයෙන් සිත අපිරිසිදුව සිදු කරන මෙබඳු ක්‍රියාවන්හි විපාක වශයෙන් මෙලොවදී ම දුක් විපාක විඳීමට සිදුවේ (ඉධ තප්පති). පාපමිත්‍ර ආශ්‍රය හා අසද්ධර්ම ශ්‍රවණය මීට මුල් වන අතර මෙබඳු ජීවිතයක ප්‍රතිඵල වශයෙන් පරලොව දී දුගතිගාමී ව තවදුරටත් දුකට පත් වේ (පෙච්ච තප්පති). නරක, තිරසන්, ප්‍රේත, අසුර යන සතර අපායන්හි ඉපදීමට සිදු වන්නේ මෙබඳු අකුසල කර්මයන්හි විපාක වශයෙනි. තමන් සිදුකළ අකුසල කර්මයන්හි විපාක වශයෙන් දුක් විඳින විට තමාගේ අතීත අකුසල කර්ම සිහිපත් වී තමන් විසින් මෙබඳු අකුසල ධර්ම කරන ලදැයි බෙහෙවින් දුකට පත් වේ (භීයො තප්පති දුග්ගතිං ගතො).

2. සුදු විපාක ඇති සුදු කර්ම යනු කම්මස්සකතා සම්මාදිට්ඨියෙන් යුතුව ප්‍රාණඝාතාදි දස අකුසලයන්ගෙන් වෙන් ව දාන, සීල, භාවනා යන ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාවන්හි නිරතුරුව යෙදීමයි. සිත පිරිසිදුව කරන මෙබඳු කර්මයන්හි ආනිසංස වශයෙන් මෙලොව දී ම සැප සතුට දියුණු වන අතර (ඉධ නන්දති) පරලොව දී ද සතුට වේ (පෙච්ච නන්දති). කුසල කර්මයන්හි ඉෂ්ට විපාක වශයෙන් දිව්‍ය බ්‍රහ්ම යන සුගතීන්හි ඉපිද සැප සම්පත් ලැබෙන විට වඩාත් සතුටු වේ (භීයො නන්දති සුග්ගතිං ගතො).

සිදු කරනු ලබන යහපත් කර්මයන්ට අනුව ලැබෙන ආනිසංස පිළිබඳව කිංදද සූත්‍රයෙහි මෙසේ සඳහන් වේ. ඒ අනුව,

*'අන්නදො බලදො හොති* - *වණ්ණදො හොති වත්ථදො,*
*යානදො සුඛදො හොති* - *දීපදො හොති චක්ඛුදො.*
*සො ච සබ්බදදො හොති* - *යො දදාති උපස්සයං,*
*අමතං දදො ච සො හොති* - *යො ධම්මමනුසාසති.'* (සං.නි. 1, )

ආහාර දෙන්නේ බලය දෙන්නේ වෙයි. වස්ත්‍ර දෙන්නේ වර්ණය දුන්නා වේ. යාන - වාහන දෙන්නේ සැපය දෙන්නේ වේ. පහන් ආලෝකය දෙන්නේ ඇස් දෙන්නේ වේ. යමෙක් නිවසක් දෙන්නේ ද ඔහු සියල්ල දෙන්නේ වේ. යමෙක් ධර්මයෙන් අනුශාසනා කෙරේ ද ඔහු අමෘතය දෙන්නේ වේ.

3. කළුසුදු විපාක ඇති කළුසුදු කර්ම යනු කුසල් කරන අතර අකුසලයන්හි ද නිරත වීමයි. නැතහොත් අකුසල් කරන අතර කුසල කර්මයන්හි ද යෙදීමයි. එසේත් නැතහොත් තණ්හා දිට්ඨි මාන යන ප්‍රපංච සහිතව දානාදී පින්කම් කිරීමයි. මෙහි විපාක වශයෙන් සුගතියක ඉපදුණ විට සැප සහ දුක් යන දෙක ම තමා වෙත පැමිණේ. ඇතැම් විටෙක දුගතියක ඉපදුණහොත් තමා කළ දානාදි පින්කම්හි ආනිසංස වශයෙන් භවභොග සම්පත් ලැබේ.

ඉහත දැක්වූ පරිදි කර්මයන්ට අනුරූප ව විපාක ලැබීමක් දක්නට ලැබුණ ද බුදුසමයට අනුව කර්මය කරන්නෙක් හෝ එහි ඵල විඳින්නෙක් හෝ නොමැත. හුදෙක් පවත්නේ ශුද්ධ ධර්ම පමණි.

*'කම්මස්සකාරකො නත්ථි* - *විපාකස්ස ච වේදකො,*
*සුද්ධධම්මා පවත්තන්ති* - *එවෙතං සම්මදස්සනං.'*

බුදුරජාණන් වහන්සේ නමක් ලොව පහළ වී නැති සමයක ඉහත සඳහන් ප්‍රභේද තුනට ම අයත් කර්ම සිදු කරන සත්ත්වයන් දක ගත හැක. ඒ කුමන කර්මය කළ ද සංසාර චක්‍රයෙන් නිදහස්වීමක් නැත. කලෙක සැප විපාක වින්ද ද තවත් කලෙක දුගතියට වැටේ. තව ද සැප විඳින අතර ලෙඩවීම්, මහලුවීම්, මරණ ආදි ව්‍යසනයන්ට පත්වීමට ද සිදුවේ. මෙබඳු තත්ත්වයක් මත බුදුදහමින් අනුශාසනා කරන්නේ සම්පූර්ණයෙන් කර්ම චක්‍රයෙන් නිදහස් වන මාවතයි.

කම්මනිදාන සූත්‍රයට අනුව කර්මක්ෂය කිරීම සම්බන්ධ ව සඳහන් වේ.

'ලෝභ, දෝස, මෝහ චේතනා මුල් වී හටගන්නා කර්ම අකුසල නම් වේ. එම කර්ම සාවද්‍යයි, ඒ කර්මවලට දුක් විපාක විඳීමට සිදු වේ. මෙම කර්ම 'කර්මසමුදය' (හටගැනීම) පිණිස පවතී. මේ කර්ම කර්ම නිරෝධය පිණිස හේතු නොවේ.' 'අලෝභ, අදෝස, අමෝහ චේතනා මුල් වී හටගන්නා කර්ම කුසලයි. ඒ කර්ම නිරවද්‍යයි වන අතර සැප විපාක ගෙන දේ. එම කර්ම 'කර්මනිරෝධය' පිණිස හේතු වේ. ඒ කර්ම කර්ම සමුදය පිණිස හේතු නොවේ.'

මෙම සූත්‍රයෙන් ප්‍රකට වන ප්‍රධාන අදහස නම් යළි කර්ම හට ගැනීමට හේතු වන කර්ම මෙන් ම යළි කර්ම හටනොගැනීමට ද හේතු වන කර්ම පවත්නා බවයි. බුදුසමයෙන් විශේෂයෙන් අවධාරණය කෙරෙන්නේ කර්මක්ෂය කිරීම් සංඛ්‍යාත කර්ම සඳහායි. එනම් නිවන සඳහා හේතු වන කුසල කර්ම කිරීමට මග පෙන්වීමයි. මෙය බුදුදහමට පමණක් සුවිශේෂී වූ ඉගැන්වීමකි. යොනිසොමනසිකාරය අනුව නාමරූප ධර්ම පිළිබඳ ව නුවණින් විමසා බලා නිවැරදි කුසල ක්‍රියාවන්හි යෙදීමේ හැකියාව මිනිසා සතුව පවතී. චේතනාත්මක ව ක්‍රියා කිරීමේ හැකියාව පුද්ගලයා සතු ව පවත්නා බව බුදුරජාණන් වහන්සේ අවධාරණය කරන හෙයින් උන් වහන්සේ කර්මවාදී හා ක්‍රියාවාදී බව සඳහන් වේ (සමණො ඛලු භො ගොතමො කම්මවාදී කිරියවාදී, ම.නි. ii)

නිබ්බේධික පරියාය සූත්‍රයෙහි කර්මය පිළිබඳ විධිමත් විස්තරයක් ඇතුළත් වේ. ඊට අනුව කර්මය තේමා කොට ප්‍රශ්න හයක් මතුකොට ඊට පිළිතුරු සැපයේ. මෙහිදී කර්මය යනුවෙන් දක්වෙන්නේ සංචේතනාවයි. කර්මයේ නිදානය වශයෙන් සඳහන් වන්නේ ස්පර්ශයයි (ඵස්සො භික්ඛවෙ කම්මානං නිදාන සම්භවො). කර්මයේ නිරෝධය ස්පර්ශ නිරෝධයයි (ඵස්සනිරොධො භික්ඛවෙ කම්මානං නිරොධො). එබඳු වූ කර්මය නිරෝධ කරන මාර්ගය ලෙස පෙන්නුම් කර ඇත්තේ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි (අයමෙව අරියො අට්ඨංගිකො මග්ගො කම්මනිරොධගාමිනීපටිපදා)

4. සත්ත්වය කර්මය දායාද කොට කර්මය ස්වකීය කොට ඇත්තේ නමුදු කර්ම චක්‍රයට ම නතු වී එහි වහලෙකු සේ හිර කොට තැබීමට බුදුසමය උත්සාහ නොකරයි. කර්මය අභිබවා ගොස් කර්මක්ෂය කිරීමේ මාර්ගය බුදුසමයෙහි පැහැදිලි ව දේශනා කොට ඇත. එනම් කළු ද නොවන සුදු ද නොවන කර්ම සිදු කිරීමයි. කර්මක්ෂය කිරීමට හේතුවන නිර්වාණාවබෝධයට සෘජුව හේතුවන කර්ම මෙනමින් හැඳින්වේ. බුදුදහමේ මූලික ඉලක්කය කර්මක්ෂය කොට සත්ත්වයා සසර දුකින් නිදහස් කරවීමයි. සත්වයාට විමුක්තිය ලද හැක්කේ කර්ම බන්ධනයෙන් නිදහස් වීමෙනි. බෝසතුන් මෙලොව උපත ලද මොහොතෙහි 'මේ මාගේ අවසන් ජාතිය බවත් නැවත භවයක් නැති බවත්' (අයමන්තිමා ජාති නත්ථි'දානි පුනබ්භවො) ප්‍රකාශ කළේ මෙකී කර්මක්ෂය කිරීම අරභයා ය.

ඒ සඳහා විවේකනිස්සිත ව විරාගනිස්සිත ව නිරොධනිස්සිත ව නිවනට බර ව සත්ත බොජ්ඣංග ධර්ම වඩා තෘෂ්ණාව ක්ෂය කළ යුතු ව පවතී. සත්ත බොජ්ඣංග වැඩෙන තෘෂ්ණාව සපුරා ප්‍රහීණ වන නිවන් මග වශයෙන් දක්වා ඇත්තේ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. තෘෂ්ණාව ප්‍රහීණ වීමෙන් කර්මක්ෂය වන අතර කර්මක්ෂය වීමෙන් දුක් ප්‍රහීණ වේ. තෘෂ්ණාව ක්ෂය කිරීමෙන් දුඃඛක්ෂය වන අතර දුඃඛක්ෂය කිරීමෙන් කර්මක්ෂය වන බව බය සූත්‍රයෙහි දක්වේ (තණ්හාය පහානා කම්මං පහීයති. කම්මස්ස පහානා දුක්ඛං පහීයති. ..... තණ්හක්ඛයා කම්මක්ඛයො. කම්මක්ඛයා

දුක්ඛක්ඛයොති, සං.නි. v(1), 176 පිට). මෙලෙස තෘෂ්ණාව දුරු කිරීමෙන් කර්මක්ෂය කළ යුතු බව බුදුසමයෙහි අනුශාසනාවයි.

කර්මක්ෂය කරමින් නිර්වාණාවබෝධය සාක්ෂාත් කිරීම සඳහා පටිච්චසමුප්පාදය පදනම් කොටගත් අනිත්‍යතාව පිළිබඳ මනා වැටහීමක් ඇති කර ගැනීම අවශ්‍ය වේ. එනම් අප ජීවිතයට සැබැවින් ම සිදුවන්නේ කුමක් ද යන්න පිළිබඳ යථාවබෝධයයි. අප ජීවත් වෙනවා යනු ඇස, කන, නාසය, දිව, කය, මනස යන ඉන්ද්‍රියවලට රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම යනු අරමුණු ස්පර්ශ වීමයි. මෙලෙස අභ්‍යන්තර ඉන්ද්‍රිය හා බාහිර අරමුණු එකට සම්බන්ධ වීමෙන් රූපාදිය පිළිබඳ අද්දැකීම් ලැබීම ජීවත්වීම වශයෙන් සැලකේ. මෙම අද්දැකීම්වල ස්වභාවය නම් පෙර නොතිබී හටගෙන ඉතිරි නැතිව නිරුද්ධවීමයි. රූප, ශබ්දාදි කිසියම් අද්දැකීමක් ලැබීම යනු රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන ස්කන්ධ පංචකය ක්ෂණිකව හටගැනීමයි. පෙර නොතිබී හටගන්නා මෙම ස්කන්ධ පංචකය ඉතිරි නැතිව නිරුද්ධ වේ (අහුත්වා සම්භූතං හුත්වා න භවිස්සති). එහෙත් අප තුළ පවත්නා අනවබෝධය හෙවත් අවිද්‍යාව නිසා මෙම අද්දැකීම පෙර තිබූ දෙයක් වශයෙන් ද ඉදිරියටත් නොනැසී පවත්නා දෙයක් ලෙස වැටහේ. දුක හටගන්නේ මෙම අනවබෝධය නිසයි. එනිසා මෙම අවිද්‍යාව දුරුවන ලෙස යළි යළිත් රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ ය යන ස්කන්ධ පංචකයේ හටගැනීම (සමුදය), නිරුද්ධවීම (වය) මැනැවින් අවබෝධ කර ගැනීමට සමත් වුවහොත් බාහිර අරමුණු නිසා ඇති වන දුක ක්‍රමයෙන් දුරු වී සසර දුකින් ද සපුරා නිදහස්වීමට අවකාශ සැලසේ. මෙලෙස ජීවිතයේ යථාර්ථය නුවණින් මෙනෙහි කිරීමේ ප්‍රතිඵල වශයෙන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණය මැනැවින් ප්‍රකට වේ. මේ සඳහා කල්‍යාණ මිත්‍ර ආශ්‍රයෙන් අනිත්‍යාව ප්‍රකට වන ධර්ම දේශනා නිතර නිතර ශ්‍රවණය කිරීම අවශ්‍ය කෙරේ. තවද ඇසූ දහම් කරුණු නුවණින් මෙනෙහි කිරීමත් සමථ විදර්ශනා භාවනා වඩමින් එම දහම තම ජීවිත තුළ ස්ථාවර කර ගැනීමත් අවශ්‍ය වේ. මෙම දහම් ප්‍රතිපදාවෙහි අප්‍රමාදීව යෙදීම නොකඩවා සිදු කළ යුතුව පවතී.

## ඔබ සැමට තෙරුවන් සරණයි !

{ලොස් ඇන්ජලින් බෞද්ධ විහාරස්ථානයෙහි ස්වාමීන් වහන්සේ විසින් මෙහෙයවනු ලබන

## ධර්ම චාරිකා වැඩසටහන (4.1.2017)}

## Sponsers:

Dr. Lasika Senevirathna, Dr. Chandrika Senevirathna, Parents and Children